කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

# අ.පො.ස. (සා.පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍ර අංක 01

## නැටුම් දේශීය 1 පත්‍රය

**කාලය පැය 1 යි**

- **අංක 01 සිට 40 දක්වා සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 30 - 40 දක්වා ඔබ ඉගෙන ගන්නා සම්ප්‍රදායට අදාල කොටස තෝරා ගන්න.**
- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන තෝරන්න.**

1. සරඹ අභ්‍යාස කිරීමේදී සමගුණ, දෙගුණ, සිව්ගුණ වශයෙන් හඳුන්වනු ලබන්නේ ....................... ලයට නැටීමයි.
   i. ත්‍රිවිධ
   ii. විලම්භ
   iii. ද්‍රැත
   iv. මධ්‍ය

2. ......................... නම් ද්‍රවිඩ ජන නැටුම දේශීය කළගෙඩි නැටුම හා සමාන වේ.
   i. කෝලාට්ටම්
   ii. පින්නල් කෝලාට්ටම්
   iii. සෙම්බු
   iv. බුම්මැඩි

3. නවග්‍රහයින්ගෙන් ඇතිවන්නාවූ අපල උපද්‍රව දුරුකර ගැනීම සඳහා දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම යොදා ගන්නා ශාන්තිකර්මයක් ලෙස ........................... නම් කළහැකිය.
   i. කිරිමඩුව
   ii. දෙවොල්මඩුව
   iii. බලියාගය
   iv. පහන්මඩුව

4. එකැස් බෙරය නමින් හැඳින්වෙන්නේ .............. යි.
    i. පොකුරු බෙරය
    ii. රබාන
    iii. දවුල
    iv. උඩැක්කිය

5. ගායනා රහිත නර්තන අංගයක් ලෙස ........... නම් කළහැකිය.
    i. වන්නම්
    ii. සව්දම්
    iii. ගැමිනැටුම්
    iv. වට්ටම්

6. ''ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට හිරු දෙවි අධිපති වන්නේ'' යන ගායනා විශේෂය අයත් වන්නේ ............ වලටය.
    i. ටීකා සීපද
    ii. මෝල්ගස් කවි
    iii. මල්යහන් කවි
    iv. ග්‍රහපන්ති කවි

7. ආංගික අභිනය ප්‍රධාන වන සහ වාචික අභිනය නොයෙදෙන නාට්‍ය සම්ප්‍රදාය ලෙස ................ නම්කළ හැකිය.
    i. ශෛලිගත නාට්‍ය
    ii. මුද්‍රානාට්‍ය
    iii. නාඩගම්
    iv. ගැමි නාට්‍ය

8. ............රංගභූමිය ලෙස යොදාගනු ලබන්නේ සොකරි ජන නාටකයේය.
    i. තානායම් පොළ
    ii. පින්තූර රාමු වේදිකාව
    iii. කමත
    iv. ප්‍රසාංගික වේදිකාව

9. වෙස්මුහුණු පැළඳ නැටීම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ........... නර්තන සම්ප්‍රදායේදීය.
   i. උඩරට
   ii. පහතරට
   iii. සබරගමු
   iv. ඉංදීය

10. ප්‍රස්තාරකරණයේදී තිත් ^ හා තෙයි / වශයෙන් සලකුණු කරනු ලබන්නේ මින් කුමක් ද?
   i. අනාඝාතාත්මක අක්ෂර
   ii. ආඝාතය
   iii. බෙරවාදනය
   iv. නාද මාලාව

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | නල දමයන්ති | ගිනිහොරා | රාමසීතා | කරදිය |
| B | සත්පත්තිනි | වෙන්ඩාව | කූඹි කථාව | පුංගී |
| C | මද්දලය | රාස්ලීලා | පොන්නානි | ඉලතාලම් |

11. කථකලි නර්තන සම්ප්‍රදායේ දී සිංකිඩ් විසින් වාදනය කරනු ලබන භාණ්ඩය දක්නට ලැබෙන්නේ
   i. A පේළියේ 2,3 තීරුවලය
   ii. B, C පේළි සහ 1,2 තීරුවලය
   iii. C පේළියේ 4 තීරුවේය
   iv. A පේළියේ 4 තීරුවේය

12. මණිපුරි නර්තන අංගයක් සහ ඒ හා බැඳි ප්‍රධාන අවනද්ධ භාණ්ඩය දක්නට ලැබෙන්නේ
   i. AB පේළි සහ 1,2 තීරුවලය
   ii. BC පේළි සහ 1,2 තීරුවලය
   iii. B පේළියේ 2,4 තීරුවලය
   iv. BC පේළි සහ 2,4 තීරුවලය

13. චිත්‍රසේන මහතා විසින් නිෂ්පාදිත මුද්‍රානාට්‍ය දක්නට ලැබෙන්නේ
    i. AB පේළි සහ 1,2,3 තීරුවලය
    ii. A පේළියේ 1,3,4 තීරුවලය
    iii. B පේළියේ 1,3 තීරුවලය
    iv. AB පේළි සහ 1,2 තීරුවලය

14. ධීවර චරිත දක්නට ලැබෙන මුද්‍රානාට්‍ය ඇතුලත් වන්නේ
    i. A පේළියේ 4 වැනි තීරුවේය
    ii. B පේළියේ 1 වැනි තීරුවේය
    iii. A පේළියේ 1 හා 2 තීරුවලය
    iv. A පේළියේ 1 හා 3 තීරුවලය

15. අංජලිකා චිත්‍රසේන විසින් රංග රචනය කරන ලද මුද්‍රා නාට්‍ය ඇතුල්වන්නේ
    i. A පේළියේ 3 තීරුවේය
    ii. B පේළියේ 3 තීරුවේය
    iii. C පේළියේ 4 තීරුවේය
    iv. AB පේළියේ සහ 3 තීරුවේය

16. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ
    i. මහා පරාක්‍රමබාහුය
    ii. කාලි දාසය
    iii. ශ්‍රී වික්‍රම රාජසිංහය
    iv. රවීන්ද්‍රනාත් තාගෝර්තුමාය



17. උඩරට නර්තන සම්ප්‍රදායේ දියුණුවට කටයුතු කළ ප්‍රවීණගත් කතුවරයෙකි
    i. මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා
    ii. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහකා
    iii. මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා
    iv. මහාචාර්ය ජයසේන කොට්ටේගොඩ මහතා

18. චිත්‍ර විෂයේ රේඛාව නම් නර්තනයේ මාධ්‍ය වන්නේ

i. නාදයයි
ii. වාදනයයි
iii. අභිනයයි
iv. චලනයයි

19. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේදි ගැටබෙරය හා යක්බෙරය අයත් වන්නේ
i. අතතයටය
ii. විතතයටය
iii. ආතත විතතටය
iv. ඝනයටය

20. රසභාව සංකල්පය මැනවින් විග්‍රහකොට ඇති ග්‍රන්ථ දෙකකි
i. සිංහල නර්තන කලාව හා උඩරට නැටුම් කලාව
ii. පහතරට නර්තනය හා සිංහල නර්තන කලාව
iii. අපේ දේශීය නාට්‍යකලාව සහ ආසියානු නාට්‍ය හා රංගකලාව
iv. නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පනය

21. ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ
i. කවිකාර මඩුවේය
ii. නැටුම් ඉලංගමේය
iii. දළදා මාළිගාවේය
iv. සමන් දේවාලයේය

22. අනාඝාතාත්මක ගායනා ලෙස නම් කළ හැකි වන්නේ
i. පන්තේරු සහ උඩැක්කි
ii. වන්නම් සහ මල්යහන් කවි
iii. ටීකා සීපද සහ ප්‍රසස්ති
iv. පැල් කවි සහ පතල්කවි

23. යක් දෙස්සන් වහයෙන් ප්‍රධාන ඇදුරන් හඳුන්වනු ලබන්නේ
i. පහතරට දෙවොල් මඩුවේදීය
ii. සබරගමු පහන් මඩුවේදීය

iii. උඩරට කොහොඹ කංකාරියේදීය
iv. බලියාගයේදීය

24. මහනුවර දළදා පෙරහැරේ චාරිත්‍ර විධි අවසන් කරන්නේ
i. රන්දෝලි පෙරහැරෙනි
ii. කප් සිටුවීමෙනි
iii. දිය කැපීමෙනි
iv. කුඹල් පෙරහැරෙනි

25. යුධ අවස්ථාවලදී දක්නට ලැබෙන වාදන අවස්ථා වන්නේ
i. හේවිසි හා මඟුල්බෙර
ii. අණබෙර හා රණබෙර
iii. මළබෙර හා රණබෙර
iv. මඟුල් බෙර හා තේවා හේවිසි

26. පොළොන්නරුවේ සරස්වතී මණ්ඩපය ඉදිකරන ලද්දේ
i. මහා පරාක්‍රමබාහු රජුය
ii. දුටුගැමුණු රජුය
iii. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුය
iv. නිශ්ශංක මල්ල රජුය

27. කෝලම් නාටක චරිත නිරූපණයේදී අධිමානුෂ චරිත වන්නේ
i. නාග රාක්ෂ, ගුරුළු රාක්ෂ, මරක්කල ය
ii. ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නරසිංහ අවතාර ය
iii. ජසයා, ලෙංචිනා, මුදලි, නොංචි ය
iv. සිංහ, වලස්, ගොන්, කොටි ය

28. අනුරාධපුරයුගයේ උත්සව අවස්ථාවන් වලදී පණ්ඩුකාභය රජ චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් උදෙසා දෙව් මිනිස් නැටුම් කරවු බව සඳහන් වන්නේ
i. චූල වංශයේය
ii. දීපවංශයේය
iii. මහාවංශයේය

iv. ථූපවංශයේය

29. සතර අභිනවයේදී වේෂ නිරූපණය අයත් වන්නේ

i. ආංගික අභිනයටය
ii. වාචික අභිනයටය
iii. සාත්වික අභිනයටය
iv. ආහාර්ය අභිනයටය

30. වැදියකුන් හා බණ්ඩාර දෙවි සත්කට්ටුව පුදලබන්නේ

i. බලියාගයේදීය
ii. කිරිමඩුවේදීය
iii. දෙවොල් මඩුවේය
iv. කොහොඹ කංකාරියේදීය

## II කොටස - උඩරට නර්තනය

31. ʻʻ තෙයියත් තෙයි තා තිත් තෙයි තා ʼʼ යනු

i. අටවන පාසරඹයයි
ii. නවවන පාසරඹයයි
iii. දසවන පාසරඹයයි
iv. හත්වන පාසරඹයයි

32. ʻʻතාම් දොමිත ගත දොම්කිත...ʼʼ මෙම පද කොටස සහිත අඩව්ව අයත්වන්නේ

i. කුද ගජිගත වට්ටමටය
ii. දොංජිංත ගත දොතං වට්ටමටය
iii. ගොග් ගොග් ජිං ජිං ගත වට්ටමටය
iv. කුදාංත ගත දොම් වට්ටමටය

33. කොහොඹා කංකාරි ශාන්තිකර්මයට අයත් ගායනා සහිත නර්තන අංග දෙකකි

i. කොහොඹා හෑල්ල සහ අස්නේ
ii. යක් ඇණුම සහ දුනු මාලප්පුව
iii. හත් පද සහ ආවැන්දුම
iv. කොල්පාඩුව සහ මල්හත්පද

34. මාත්‍රා $2+4$ දෙතිතට නර්තනය කරනු ලබන වන්නමකි

i. සැවුලා
ii. තුරඟා
iii. මුෂලඩි
iv. සිංහරාජ

35. වන පැත්ත බියපත්ව සයනම්//... මුසලඩි වන්නමට අයත් මෙම කවියේ ඉතිරි කොටස වන්නේ

i. හිරුත් අවර ගිරත් පැමිණි.....
ii. විටත් ඔවුන තුටත් සිතින.....
iii. දුටත් යනෙන විටත් දුවන.....
iv. ගමනක් යන විලසක් ගෙන....

36. කුද කුජිගත වට්ටමේ තාලරූපය වන්නේ

i. $4+4$ මහ තනි තිතයි
ii. $3+3$ මැදුම් තනි තිතයි
iii. $2+2$ සුළු තනි තිතයි
iv. $2+3$ සුළු මැදුම් දෙතිතයි

37. කොහොඹ කංකාරියට අයත් නාට්‍යමය පෙළපාලි වන්නේ

i. අඹවිදමන හා ඇත්බන්ධනයයි
ii. රාමා මැරීම සහ අඹවිදමනයි
iii. ගුරුගේ මාලාව සහ ගබඩාකොල්ලයයි
iv. දෙවොල් ගොඩබැසීම සහ අසුරයක්කමයි

38. ''ජෙං තත් තත් ජෙං තත් තත් ජෙංතත් තත් ජෙංතා..'' යන අඩව්ව අයත් තාල රූපය වන්නේ

i. මාත්‍රා $3+4$ මැදුම් මහ දෙතිතයි
ii. මාත්‍රා $2+4$ සුළු මහ දෙතිතයි
iii. මාත්‍රා $2+3$ සුළු මැදුම් දෙතිතයි
iv. මාත්‍රා $2+2+3$ දෙසුළු මැදුම් තුන්තිතයි

**39,40 ප්‍රශ්න වලට රූපසටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**

39. උඩරට වෙස්ඇඳුම් කට්ටලයට අයත් මෙම රූප සටහනට අනුව 1,4,6 අංකවලින් දැක්වෙන්නේ




   i. සිඛා බන්ධනය, උරබාහු හා අවුල් හැරයයි
   ii. ජටාව, නෙත්තිමාලය හා අවුල් හැරයයි
   iii. ජටාව, උරබාහු හා කෙමෙත්තයි
   iv. පායිම්පත, උරබාහු හා නෙත්තිමාලයයි

40. මෙම රූප සටහනට අනුව සිඛාබන්ධනය හා අවුල්හැරය දැක්වෙන්නේ
   i. 2 සහ 5 අංකවලිනි
   ii. 3 සහ 4 අංකවලිනි
   iii. 5 සහ 6 අංකවලිනි
   iv. 1 සහ 2 අංකවලිනි

## III කොටස - පහතරට නර්තනය

31. ''තෙයියත් තරිකිට තෙයියත් දිගතම්'' යනු
   i. අටවන පාසරඹයයි
   ii. නවවන පාසරඹයයි
   iii. දසවන පාසරඹයයි
   iv. හත්වන පාසරඹයයි

32. ''ගුද ගති ගත'' වට්ටමෙහි තාලරූපය වන්නේ
   i. මාත්‍රා $2+4$ දෙතිතය
   ii. මාත්‍රා 4 තනි තිතය
   iii. මාත්‍රා 3 තනිතිතය
   iv. මාත්‍රා 2 තනිතිතය

33. දෙවොල් මඩු ශාන්ති කර්මයේ දක්නට ලැබෙන නර්තන අංග දෙකකි
   i. යහන් දැක්ම සහ තොරන් යාගය
   ii. මුගුරුපද සහ මඩුපුරය
   iii. වාහල සහ මුදුන් තාලය

iv. කොළොන්න පද සහ යක්කුන් පදය

34. දෙසුළු මැදුම් තුන්තිතට නටනු ලබන සින්දුවන්නමකි
    i. ශුද්ධ තාලය සින්දුවන්නම
    ii. අනුරාග දණ්ඩතාලය සින්දුවන්නම
    iii. නාතිලිංචිතාලය සින්දුවන්නම
    iv. හනුමන්තා තාලය සින්දුවන්නම

35. කිපී ලොව දිලෙන තෙද තිලොනිඳුගේ...ඊශ්වර කුණ්ඩතාලය සින්දු වන්නමට අයත් මෙම කවියේ ඉතිරි කොටස වන්නේ
    i. නොපීනනු කව්ද වෙනු සරණ රැස් ගගේ.....
    ii. තෝරමිනා කිරණා නිසි අග්‍ර මිනෙවු කිරුළක දරනා....
    iii. හැපී දුක් ගසින් උත්සක ගොස් නොලගේ....
    iv. තාරඟනා මැදිනා දිසි සුබුකරා ලෙස සොම්ගුණෝනා....

36. මහ තනි තිතට අයත් බෙර පදයකි
    i. දොම් තම් ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතම්
    ii. තකදිත් තම්ගත දොම් දිම් තකදොම්
    iii. දිත්තම් දිකම් දොං දොං තාම්
    iv. දොදොම් දොම් ගදිකිට ගදිත දෙදොම් තා

37. දොවොල්මඩු ශාන්ති කර්මයට අයත් නාට්‍යමය පෙළපාලි වන්නේ
    i. පොත්කඩේ පාලිය හා මී බන්ධනයයි
    ii. රාමා මැරීම සහ යක්කම්ය
    iii. දෙවොල් ගොඩබැසීම සහ ඇත්බන්ධනයයි
    iv. ගුරුගේ මාලාව සහ අඹවිදමනයි

38. දොම්ත.... දිම්ගත ගත්තත්....දිංගත ගුංදත් තා මෙය සම්පූර්ණ වීමට සුදුසු පද ඇතුලත් වරණය තෝරන්න.
    i. දොම්ත ගුං - ගදිත ගදිතගත
    ii. ගතම් ගුං - ගද්දිත ගතගත්
    iii. දොම්ගත - දිංගත ගත කුද

iv. ගතම් ගුං - රෙගත රෙගත ගුද

- **39 - 40 ප්‍රශ්ණ වලට රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න**

39. රූපයේ දැක්වෙන පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අනුව නළල් පටිය, පබළු මාලය, පබළු හැට්ටය දක්නට ලැබෙන්නේ




i. 1,2 සහ 3 අංකවලිනි
ii. 3,4 සහ 5 අංකවලිනි
iii. 1,3 සහ 4 අංක වලිනි
iv. 1,4 සහ 5 අංකවලිනි

40. 1,2 අංකවලින් දැක්වෙන්නේ

i. නළල් පටිය හා ජටාවය
ii. පබළු මාලය සහ නළල් පටියයි
iii. ජටාව සහ පබළු කරමාලයයි
iv. හැට්ටය සහ නෙත්ති මාලයයි

කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

## අ.පො.ස. (සා.පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍ර අංක 01

## නැටුම් දේශීය II පත්‍රය

(කාලය පැය 02)

- **පළමුවැනි ප්‍රශ්නය අනෙවාර්ය වේ.**
- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමිවේ.**

1. සියලුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.
   i. අ.පො.ස උසස් පෙළ සඳහා නර්තන විෂයයක් වශයෙන් ඇතුලත් වුයේ.............. වසරේ සිටය.
   ii. 1934 වර්ෂයේ ....................තුමාගේ පැමිණීමත් සමඟ නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇතිවිය.
   iii. දේශීය නර්තන සම්ප්‍රදායයන් තුන පිළිබඳ හා නර්තන විකාශනය පිළිබඳ තොරතුරු ඇතුලත් සිංහල නර්තන කලාව (1993) කෘතිය ලියන ලද්දේ ............ විසිනි.
   iv. සිංහල ගොයම් නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි...............
   v. නවාබ් වලිජ් අලිෂා සහ අච්චන් මහරාජ් .....................නර්තනයේ ප්‍රවර්ධනයට දායක වු ශිල්පීන් දෙදෙනෙකි.
   vi. කුඹී කථාව මුද්‍රානාට්‍යයේ රංග රචනය කර ඇත්තේ ............... මහත්මියයි.
   vii. උඩරට ප්‍රධාන ජන නාටකයකි.................
   viii. ......... ලීමල්ලිය භාවිතා කරමින් නටනු ලබන දේශීය ගැමි නැටුමකි.
   ix. උඩරට, පහතරට, සබරගමු ප්‍රධාන ශාන්තිකර්ම තුනෙහිම සමාන චාරිත්‍ර දෙකක් ලෙස 1......................2......................... නම්කළ හැකිය.
   x. කෝලම් ජන නාටකයෙහි රඟමඬල 1....................... වන අතර 2................. රජුගේ බිසවට නැටුම් සිනාකෙළි දැකීමටවත් දොළදුකක් හේතුවෙන් කෝළම් නැටුම් බිහිවිය.

2. i. ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් මාත්‍රා 2 + 2 + 3 තාලයට බෙරපදයක් ප්‍රස්තාර කරන්න. (ල 4)

ii. ''රනේ රුවසෙ වත රුවින් දිලේදෝ...'' යන ගී පාදය මාත්‍රා තුනේ තනිතිතට ප්‍රස්ථාර කරන්න. (ල 4)

iii. සැවුලා වන්නම හෝ නාති ලිංචිතාලය සින්දු වන්නමෙහි කස්තිරම / ඉරට්ටිය ප්‍රස්ථාර කරන්න. (ල 4)

3. පහත සඳහන් මාතෘකා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

I. තනි තිතේ ප්‍රභේධ

II. රසභාව සංකල්පය

III. මානසික සවස්ථතාව හා නර්තනය

IV. කරදිය මුද්‍රානාට්‍ය

V. ද්‍රවිඩ ගැමි නැටුම්

4. i. උඩරට, පහතරට, සබරගමු ප්‍රධාන ශාන්තිකර්ම තුන නම්කර ඒ හා බැඳි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ල 4)

ii. එම ශාන්ති කර්ම තුනෙහි නාට්‍යමය අවස්ථා තුනක් නම්කර එක් නාට්‍යමය අවස්ථාවක් හඳුන්වන්න. (ල 4)

iii. උඩරට ප්‍රධාන ශාන්ති කර්මවල ගායන සහිත හා ගායන රහිත නර්තන අංග දෙකක් හදුන්වන්න.(ල 4)

5. i. අංග රචනයේ දී භාවිතයට ගන්නා ද්‍රව්‍ය 4 ක් නම් කරන්න. (ල 4)

ii. සරල අංග රචනය යනු කුමක් දැයි හදුන්වන්න. (ල 4)

iii. වේෂනිරූපණය රසවින්දනය කෙරෙහි බලපාන අයුරු සැකෙවින් දක්වන්න. (ල 4)

6. ''දේශීය ජන නාටක අතර සොකරි හා කෝලම් ප්‍රධානවේ''

i. සොකරි නාටකයට අයත් කවියක් ලියා දක්වන්න. (ල 4)

ii. සොකරි හා කෝලම් නාටකවල දක්නට ලැබෙන වෙනස්කම් පෙළගස්වන්න. (ල 4)

iii. කෝලම් නාටක චරිත මගින් සමාජ විවරණයක් සිදුකරන ආකාරය ලියන්න. (ල 4)

7. i. අනුරාධපුර නර්තන කලා ඉතිහාසය සම්බන්ධ මූලාශ්‍ර දෙකක් දක්වන්න. (ල 2)

ii. එම මූලාශ්‍ර ඇසුරින් නර්තනය සඳහා ලැබූ රාජානුග්‍රහය පිළිබඳ සාධක දෙකක් ඉදිරිපත් කරන්න. (ල 4)

iii. කෝට්ටේ යුගයේ ලියැවුණු සන්දේශ කාව්‍ය මගින් ඒකල පැවැති නර්තන කලාවේ තොරතුරු දිස්වන අවස්ථා පිළිබඳ සාධක දෙකක් ඇසුරින් කරුණු ඉදිරිපත් කරන්න. (ල 6)

**11 ශ්‍රේණිය දේශීය නැටුම්**

**1 පත්‍රය විසඳුම්**

1) 1
2) 3
3) 3
4) 2
5) 4
6) 4
7) 2
8) 3
9) 2
10) 2
11) 3
12) 4
13) 2
14) 1
15) 2
16) 4
17) 2
18) 4
19) 1
20) 4
21) 1
22) 4
23) 3
24) 3
25) 2
26) 1
27) 2
28) 3
29) 4
30) 4
31) 3
32) 4
33) 1
34) 1
35) 3
36) 2
37) 3
38) 2
39) 3
40) 1

## නැටුම් (දේශීය) II විසඳුම්

I. 1978

II. රවීන්ද්‍රනාත් තාගෝර්

III. මහාචාර්ය මුදියන්සේ දිසානායක

IV. අරවිවෙට්ටු

V. කථක්

VI. අංජලිකා චිත්‍රසේන

VII. සොකරි

VIII. ලීකෙළි නැටුම

IX. 1. කප්සිටුවීම    2. මඩුපේ කිරීම

X. 1. තානායම්පොළ    2. මහාසම්මත

(ල 12)

2) I.

| | ^1 2 | ^1 2 | 1´ 2 3 | ^1 2 | ^1 2 | 1´ 2 3 |
|---|---|---|---|---|---|---|
| උඩරට | දොම් තකු | දොම් තකු | දොං ජිං - | ගත් - | තත් - | ජිං තරි කිට |
| පහතරට | දිත් - | තම් - | දි ත ම් | දොං - | දොං - | තා - ම් |

(ල 4)

II.

| | | | |
|---|---|---|---|
| 1´ 2 3 | 1´ 2 3 | 1´ 2 3 | 1´ 2 3 |
| ර නේ - | රු ව සෙ | ව ත - | - - - |
| රු වින් - | දි ලේ - | දෝ - - | - - - |

(ල 4)

III. උඩරට කස්තිරම - සැවුලා වන්නම

| ^1 2 | 1/ 2 3 4 | ^1 2 | 1/ 2 3 4 |
|---|---|---|---|
| කු ද | ග ජි ග ත | කු ද | ග ජි ග ත |
| කු ද | ග ජි ග ත | කු ද | තා - - -// |
| කු ද | ග ජි ග ත | කු ද | තා - - -// |
| කු ද | තා - - - | කු ද | තා - - - |
| කු ද | ග ජි ග ත | කු ද | ග ජි ග ත |
| කු ද | ග ජි ග ත | කු ද | තා - - - |

III. පහතරට - නාති ලිංචි තාලය - ඉරට්ටිය

| ^1 2 | 1/ 2 3 4 | ^1 2 | 1/ 2 3 4 |
|---|---|---|---|
| දොම් - | තත් - දිමි - | ග ත | ගු ගු දි ත |
| ග ත | ගුහි තිග දිරි කිට | දොම් - | ග ත ග ත |
| ගුම් - | දා - | | |

(ල 4)

3) මාතෘකා 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

I. තනිතිතේ ප්‍රභේධ -

සුළු තනිතිත, මැදුම් තනිතිත, මහතනිතිත යන තනිතිතේ ප්‍රභේධ මාත්‍රා නියමයන් දක්වා කෙටියෙන් විස්තර කර තිබීම....

II. රසභාව සංකල්පය -

රසභාව සංකල්පය හඳුන්වා රස නිෂ්පත්තියේ දි මුල්වන ස්ථායිභාව නවය හා එමඟින් උපදින රස නවය නම්කොට තිබීම.

III. මානසික සවස්ථතාව හා නර්තනය -

මානසික සවස්ථාතාව යන්න යන්න කෙටියෙන් පැහැදිලි කර ඒ සඳහා නර්තනය යොදාගන්නා අයුරු හා මානසික සංස්ථාතාව පවත්වා ගැනීමට නර්තනය ඉවහල් වන අයුරු කෙටියෙන් දක්වා තිබීම...

IV. කරදිය මුද්‍රානාට්‍ය -

ජන ජීවිතයේ දුක් ගැහැට තේමාවී ඇතිබව, බලවතා විසින් දුබලයා ග්‍රහණය කරගැනීම... හා ඒ හා සීසීචන්ද්‍රගේ කථා පුවත.... පසුබිම් කරගෙන විග්‍රහ කරන අයුරු කෙටියෙන් පැහැදිලි කර තිබීම.

V. ද්‍රවිඩ ගැමිනැටුම -

සෙම්බු, කෝලාට්ටම්, පින්නල් කෝලාට්ටම්, අරවි වෙට්ටු සුලකු, කාවඩි, කුම්මි යන ද්‍රවිඩ ගැමි නැටුම් 3 ක් හෝ.... නම් කොට කෙටියෙන් ද්‍රවිඩ ගැමි නැටුම් පිළිබඳ හඳුන්වා තිබීම.

( ල $4 \times 3 = 12$)

4) i.

| | | | |
|---|---|---|---|
| උඩරට | - | කොහොඹකංකාරිය | - ගැටබෙරය |
| පහතරට | - | දොවොල් මඩුව | - යක්බෙරය |
| සබරගමු | - | පහන් මඩුව | - දවුල |

වශයෙන් නම්කර තිබීම

(ල 3)

ii.

| | | |
|---|---|---|
| උඩරට | - | ගුරුගේ මාලාව හෝ වෙනත් |
| පහතරට | - | දෙවොල් ගොඩ බැසීම හෝ වෙනත් |
| සබරගමු | - | අඹවිඳමන හෝ වෙනත් |

වශයෙන් නම්කර චික්නාට්‍යමය පෙලපාලියක් හඳුන්වා තිබීමට

(ල 4)

iii. කොහොඹකංකාරිය

ගායනා සහිත

නර්තන අංග : අස්නේ, කොහොඹා හෑල්ල.... වලින් එකක්

හා

ගායනා රහිත

නර්තන අංග : යක් ඇනුම, ආවැන්දුම ..... නර්තනාංග

වලින් එකක් හඳුන්වා තිබීමට

(ල 5)

5) i. මූලික ආලේපන

අයිබ්‍රෝ පෙන්සිල් / අයි ෂැඩෝ / ලිප්ස්ටික් .......... වශයෙන් ද්‍රව්‍ය 4 ක් නම්කර තිබීමට

(ල 4)

ii. මූලික වශයෙන් සරල අංගරචනය, චරිතාංග අංග රචනය වශයෙන් කොටස් දෙකක අංගරචනයෙහි ඇති බව දක්වා ඒවා මුහුණ ප්‍රධානකොට ඇති අඟ පසඟ චරිතයේ ස්වභාවයට අවශ්‍ය පරිදි හැඩ ගැන්වීම අංගරචනය වශයෙන් හඳුන්වා කෙනෙකුගේ බාහිර ස්වරූපය ඒ ඇසුරින්ම අංගරචනය කිරීම සරල හෙවත් ස්වභාවික අංග රචනය වශයෙන් දක්වා තිබීමට.....

(ල 4)

iii. රස වින්දනය සඳහා වේෂ නිරූපණය බලපාන අයුරු විස්තර කර තිබීම.

(ල 5)

6) i. ගුරුහාමි

වමත සුරත නලළලේ අළු ගාගෙන

දෑත් දෙබැම කේ සෝරුද ගාගෙන

සිරිත ලෙසට ගඩු ගුඩාව ඇරගෙන

ගනිති නිමිති පොත අතකට ඇරගෙන

සොකරි

අඳුන්ගාන්නී නෙත් දෙක ....

සොකරි එන්නී.......

පරයා

ඉතින් කියන්නේ.....වැනි කවියක් සම්පූර්ණයෙන් ලියා තිබීමට

(ල 4)

ii. සොකරි හා කෝලම් වල, ප්‍රාදේශීය වහයෙන් පවතින වෙනස්කම්, රංගමඩල, නර්තනය, වාදනය, ගායනය, ඇඳුම් පැළඳුම්, අරමුණු...ආදියෙහි වෙන්සකම් වෙන්වෙන් වශයෙන් පැහැදිලිව දක්වා තිබීමට.....

(ල 4)

iii. මුදලිතුමා, ආරච්චිලා.....වැනි චරිතවල දෙබිඩි පිළිවෙත උපහාසාත්මකව හෙළිදරව් කර සමාජය වෙත පණිවිචටයක් ද ලබාදී සමාජ විවරණයක් කරන ආකාරය විස්තර කර තිබීමට....

(ල 4)

7) i. සෙල්ලිපි, ලෙන්ලිපි, මහාවංශය,...........ආදියෙන් 2 ක් ලියා තිබීමට (ල 2)

(ල 2)

ii. මහාවංශය

1. උත්සව අවස්ථාවල පණ්ඩුකාභය රජ චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් උදෙසා අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බවත්
2. දුටුගැමුණු රජ නළඟනන් පිරිවරා ගෙන කණ්ඩුල ඇතුපිට නැගී රුවන්වැලිසෑයේ ධාතුනිධන් කිරීමේ උත්සවයට.....යනාදී සාධක 2 ක් දක්වා තිබීමට

(ල 4)

iii. කෝට්ටේ යුගයේ සන්දේශකාව්‍ය

1. සැළලිහිණි සන්දේශය

- විදෙන ලෙලෙන තරුබරු පුළු ලුකුල රැදී....කවිය ලියාතිබීම ලකල පුළු ලුකුල බැඳ මිණි ...... කවිය.....

2. පරෙවි සන්දේශය

- ලෙලදුන් නව තඹ පලුවන් පාදේ....කවිය
- ලෙළෙනා දිගුනෙත නිලුපුල සේයා.... කවිය

(ල 6)

**අවසාන වාර පරීක්ෂණය** **කොළඹ කලාපය**

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 - ශ්‍රේණිය නර්තනය**

- I කොටසේ බහුවරණ ප්‍රශ්න 40ක්ද II කොටසේ ප්‍රශ්න 07ක්ද වේ.
- I කොටසේ 1 – 30 දක්වා සියළුම ප්‍රශ්න වලටද 30 – 40 දක්වා ඔබ උගත් සම්ප්‍රදායට අදාළ ප්‍රශ්න කොටස තෝරාගෙන පිළිතුරු සපයන්න.

**I කොටස**

1. ශාන්ති කර්ම වලදී දෙවියන්ට ආරාධනා කිරීම හා ආශිර්වාද ලබා ගැනීම අපේක්ෂාවෙන් වාදනය කෙරේ
   i අත්‍යා බෙර ii මගුල් බෙර iii හැන්දෑධුරය iv හේවිසි

2. ජීවන වෘත්තියක් ඇසුරෙන් නර්තනයක් නිර්මාණය කිරීමේ දී යොදා නොගත යුතු චලන වර්ගය නම්,
   i රිද්මයානුකූල චලනයි iiතාලානුකූල චලනයි
   iiiප්‍රකාශනාත්මක චලනයි ivචාරිත්‍රානුකූල චලනයි

3. බුදුන්, රජවරු, දෙවිවරුන්ගේ ගුණ වර්ණනා කරමින් ගයා ඇති ගායනා විශේෂයකි.
   i ටීකා සීපද ii දේවස්තෝත්‍ර ගායනා
   iii ප්‍රශස්ති ගායනා iv ශාන්තිකර්ම ගී

4. සිංහල, ද්‍රවිඩ හා ආදිවාසී ජනතාව එකවර සහභාගී වන පෙරහර නම්,
   i රත්නපුර සමන් දේවාල පෙරහර ii මහනුවර දළදා පෙරහර
   iii සීනිගම දේවාල පෙරහර iv රුහුණු කතරගම මහදේවාල පෙරහර

5. ගද්‍ය පද්‍ය කොටස් දෙකට අන්තර්ගත වූ සුවිශේෂ ගායන වර්ගයක් වන්නේ
   i කඩතුරා කවිය ii පතල් කවිය
   iii ටීකා සීපදය ivපැල් කවිය

අංක 06 සිට 10 තෙක් දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | ශාන්ත රසය | කඩු නැටුම් | අත්භූත රසය |
| B | මෙලෙයි යකුන් පිදීම | හගල යැදීම | මෝල්ගස් නැටුම |
| C | සාත්වික අභිනය | පත්තිනි | දෙවොල් |
| D | අංග රචනය | නාට්‍ය ශාස්ත්‍රය | වෙස් නැටුම |

6. ශාන්ත (ශම) යන භාවය මගින් නිරූපණය වන රසය සඳහන් වන්නේ
   i 1 තීරුවේ A පේළියේය. ii 2 තීරුවේ B පේළියේය.
   iii 1 තීරුවේ C පේළියේය. iv 3 තීරුවේ D පේළියේය.

7. වීර රසය ඉස්මතු කෙරෙන නර්තන අංගයක් සඳහන්ව ඇත්තේ
   i 1 තීරුවේ C පේළියේය. ii 3 තීරුවේ B පේළියේය.
   iii 3 තීරුවේ A පේළියේය. iv 2 තීරුවේ A පේළියේය.

8. කොහොඹා කංකාරියේ ශාන්ති කර්මයට ආවේණික චාරිත්‍ර විධි සඳහන් වන්නේ
   i B පේළියේ 1,2 තීරුවලය ii A පේළියේ 1,2 තීරුවලය
   iii C පේළියේ 2,3 තීරුවලය iv B පේළියේ 1 හා C පේළියේ 3

9. දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්ති කර්ම දෙකෙහිම පුද ලබන දෙවිවරු සඳහන් වන්නේ

i A පේළියේ 1 හා B පේළියේ 3 ii A පේළියේ 2 හා D පේළියේ 3

iii C පේළියේ 2 හා 3 තීරුවලය iv B පේළියේ 2 හා 3

10. අයිෂැඩො, ලිප්නයිනර්, ලිප්ස්ටික් යන ද්‍රව්‍ය අයත් වන ශිල්ප ක්‍රමය සඳහන්ව ඇත්තේ

i D පේළියේ 1 තීරුවේය ii C පේළියේ 1 තීරුවේය

iii C පේළියේ 2 හා 3 තීරුවලය iv B පේළියේ 2 හා 3 තීරුවලය

11. දිවිකදුරු ගස එතන තියෙන්නේ සත් වියතක් දිග ............................... යන හිස්තැනට අදාළ වන්නේ

i සොදින් කපන්නේ යනුවෙනි ii මිල්ල කපන්නේ යනුවෙනි

iii මොහොල කපන්නේ යනුවෙනි iv විල්ල කපන්නේ යනුවෙනි

12. ප්‍රාසාංගික කලාවක් ඉස්මතු වන අයුරින් නර්තන අංග දක්නට ලැබෙන ශව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි

i සඟරා ii ගුවන්විදුලිය iii රසවාහානාය iv රූපවාහිනිය

13. බෙර වාදනයේදී මූලිකව යොදා ගන්නා බෙර අක්ෂර .................... වේ

i ගර්භාක්ෂර ii ලඝු අක්ෂර iii සතර බීජාක්ෂර ivතාලාක්ෂර

14. පූර්ව රංග හා අපර රංග යනුවෙන් ................... නාටකය කොටස් 2කට බෙදේ

i රූකඩ ii කෝලම් iii සොකරි ivනූර්ති

15. නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිත කරන ආකාරය ලියා දැක්වීම ................... වේ

i සංස්කරණය ii අනුකරණය iii ප්‍රස්තාරකරණය iv අංග රචනය




16. ඉහත රූප වලින් මානුෂ හා අති මානුෂ චරිත අනුපිළිවෙළින් දැක්වෙන්නේ

i A හා B රූප වලිනි ii A හා C රූප වලිනි

iii B හා C රූප වලිනි iv B හා A රූප වලිනි

ප්‍රශ්න 17 සිට 21 දක්වා නිවැරදිව පිළිතුර පහත වගුව ඇසුරින් තෝරන්න




17. ආතත හා විතතාතත කොටසට අයත් භාණ්ඩ දක්නට ලැබෙන්නේ

i A කොටසට අයත් 1 හා 2 රූප වලය ii A කොටසට අයත් 2 හා B කොටසට අයත් 4 රූප වලය

iii A කොටසට අයත් 2 හා 3 රූප වලය iv B කොටසට අයත් 4 හා 5 රූප වලය

18. කතකලි නර්තනය සඳහා උපයෝගී කරගනු ලබන වාද්‍ය භාණ්ඩය දක්නට ලැබෙන්නේ

i A කොටසේ 2ය ii A කොටසේ 6ය

iii B කොටසේ 4ය iv B කොටසේ 4ය

19. දක්ෂිණ භාරතයේ කර්ණාට සංගීතය යොදාගෙන කෙරෙන භාරත නාට්‍ය සඳහා යොදා ගන්නේ

i A කොටසේ 2ය | ii B කොටසේ 4ය

iii B කොටසේ 5ය | ivB කොටසේ 6ය

20. උත්තර භාරතීය හින්දුස්ථානී සංගිතය යොදාගෙන කෙරෙන කතක් නර්තනය සඳහා යොදා ගන්නේ

i B කොටසේ 6ය | ii A කොටසේ 2ය

iii B කොටසේ 5ය | iv B කොටසේ 4ය

21. ඝන වාද්‍ය භාණ්ඩ කොටසට අයක් වන්නේ

i A කොටසේ 1ය | ii B කොටසේ 2ය

iii B කොටසේ 6ය | iv A කොටසේ 3ය

22. කොහොඹා කංකාරියේ එන නර්තනාංග දෙකකි

i අස්නේ හා වැදියක්කම | ii කොහොඹා හැල්ල හා අයිලේ යැදීම

iii අස්නේ හා යක් ඇනුම | iv යක් ඇනුම හා හගලේ යැදීම

23. ගොයම් නර්තනය නිර්මාණය කර වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමිවනුයේ

i ප්‍රවීන නර්තන ශිල්පී ප්‍රේම කුමාර එපිටවෙල මහතාටය | ii ආචාර්ය එස්. පණීභාරත මහතාටය

iii නිමල් වෙල්ගම මහතාටය | ivලයනල් බෙන්තරගේ මහතාටය

24. ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත් '' මෙම සටහන කරන ලද්දේ

i පාහියන් භික්ෂුව | ii රොබට් නොක්ස්

iii ස්පිල් බර්ජන් | iv ඉබන් බතුතාය

25. කරදිය මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළේ

i ප්‍රේමකුමාර එපිටවෙල මහතා | ii එස්. පණීභාරත මහතා

iii චිත්‍රසේන මහතා | iv නිමල් වෙල්ගම මහතා

26. කෙහොඹා කංකාරි ශාන්ති කර්මයේ වනේ යක්කමේ දී යොදා ගන්නා රංග භාණ්ඩයකි

i වංගෙඩිය සහ නවකොළ අත්ත | ii ලීයෙන් සාදන ලද දුන්න සහ ඊතලය

iii වංගෙඩිය | iv කෙසෙල් බඩ වලින් සෑදූ ඌරෙකුගේ රුව

27. විලම්බ ලයෙහි සිව් ගුණය _ හඳුන්වන්නේ

i අඩ මධ්‍ය වේ | ii මධ්‍යවේ | iii අති විලම්භ වේ | iv ධෘත වේ

28. ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ මෙම කවි පදය අයත් වන්නේ ග්‍රහයන් සඳහා කෙරෙන

i කොහොඹා ශාන්ති කර්මයටය | ii මඩු ශාන්ති කර්ම වලටය

iii බලි ශාන්ති කර්මවලටය | iv සූනියම් ශාන්තිකර්ම වලටය

29. පොළොන්නරුවේ සරස්වතී මණ්ඩපය ඉදි කරන ලද්දේ

i I වන පරාක්‍රමබාහු | ii නිශ්ශංකමල්ල | iii II වන රාජසිංහ | iv දුටුගැමුණු

30. භාරතීය නර්තනාංග වලින් අංග රචනයෙන් පෙහොසත් වූ නර්තන සම්ප්‍රදාය නම්

i භරත | ii කථක් | iii කථකලි | iv මණිපුරි

## II කොටස - උඩරට නර්තනය

31. දෙළොස් වන ගොඩ සරඹ නාමය වන්නේ

i පැනීමේ සරඹයයි | ii චන්ද්‍රිකා සරඹයයි
iii ඇල සරඹයයි | iv දෑඩියයි

32. ''දොං දොං ජිං ජිං ගජිගත'' යන බෙර පදය අයත් වන්නේ

i මුසලඩි වන්නමටය | ii සැව්ලා වන්නමටය
iii තුරඟා වන්නමටය | iv වෛරොඩි වන්නමටය

33. ''වන පැත්ත බියපත්ව සයනම්'' මෙහි දෙවන පදය වන්නේ

i නොනැවත යනු ඇත | ii දුටත් යනෙන විටත් දුවන
iii මේ ඇත්තමයි සත්ත | iv පැන අඩි පතුසි බුදිමින්

34. මාත්‍රා 2+2+4 තුන්තිතේ තාල රූපයට නටනු ලබන්නේ

i දෙංජිංත ගත දොංත වට්ටම | ii කුදාංත ගත දොං වට්ටම
iii ගුඳ ගති ගත වට්ටම | ivකුඳ කුජිගත වට්ටම

35. දෙංජිංත ගත දොංත වට්ටමට අයත් තාල රූපය වන්නේ

i මාත්‍රා 2+3 සුළු මැදුම් දෙතිතවේ | ii මාත්‍රා 2+2 සුළු තනි තිතවේ
iii මාත්‍රා 3+4 මැදුම් මහ දෙතිතවේ | ivමාත්‍රා 2+4 සුළු මැදුම් දෙතිතවේ

36. කෙහොඹා කංකාරියට අයත් ගායනය සහිත නර්තන අංග 02 කි

i කොහොඹා හැල්ල/ මඩුපුරය | ii කොහොඹා හැල්ල/ අඹවිදමන
iii ගුරුගේ මාලාව / අස්නේ | iv මඩු පුරය/ මල් මඩුපුරය

37. මහචාර්ය මුදියන්සේ දිසානායක මහතා විසින් රචිත ග්‍රන්ථයකි

i සිංහල ගැමි නාටකය | ii කොහොඹා යක් කංකාරිය හා සමාජය
iii බලි ශාන්තිකර්ම | iv වේදිකාව හා නර්තනය




38. ඉහත රූප සටහනෙන් දැක්වෙන බෙරයේ අංකය 1,2,3 පෙන්නුම් කරනුයේ
i. බෙරපුහුල, කැපුම් හම, වරපට
ii. බෙරපුහුල, කැපුම් හම,හයිතට්ටුව
iii. කන්වර, හයිතට්ටුව, වෙන්ගායම් මුද්ද
iv. වරපට,වලයම,බෙර පුහුල

39. ලීයෙන් සාදන ලද දුන්න සහ ඊතලය භාවිතා වන්නේ

i මඩුපුරය නටන අවස්ථාවේ | ii දුනුමාලප්පුව නැටීමේදී
iii උඟරා යක්කමේදී | iv වානේ යක්කමේදී

40. හඬ පුපුරා විහිදෙන ලෙස බෙරයේ වම් ඇස මැදට පුපුරා ගැසීමෙන් ........................ යන අක්ෂරය නිපද වේ

i තත් ii දිත් iii දොං iv නං

## III කොටස පහතරට නර්තනය

31. ගුදිත ගුම්/ දැහිං (දිතගත)/ ගදිතකු/ දොම් යනු

i නවවන ඉලංගම් සරඹයයි ii දහවන ඉලංගම් සරඹයයි

iii හත්වන ඉලංගම් සරඹයයි iv දෙළොස් ඉලංගම් සරඹයයි

32. නාතිලිංචි තාලය සින්දු වන්නමට අයත් බෙර පදය වන්නේ

i තකදිත්තක දොදොං දිංතක දොං ii ගුඳ ගතිගත ගදිගත

iii දොමි තම් ගත ගදිතම්ගත ගුගුදම්ගත iv තකදින් තකදොම් දොම්දොම් තකදොම්

33.රට යකුම හෙවත් රිද්දි යාගය යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ

i. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
ii. මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා
iii. මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා
iv. මහාචාර්ය එච්. එම්. ගුණතිලක මහතා

34.පහතරට සින්දු වන්නම් අතර ප්‍රථම සින්දු වන්නම ලෙස හඳුන්වන්නේ

i නාතිලිංචි සින්දු වන්නම ii ශුද්ධතලය සින්දු වන්නම

iii අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම iv හනුමන්තා තාලය

35.දෙවොල් මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය අවස්ථා දෙකකි

i දෙවොල් ගොඩ බැසීම හා අඹ විදමන ii දෙවොල් ගොඩ බැසීම හා යක්කම්

iii අඹ විදමන හා පොත් කඩේ පාලිය ivඅඹ විදමන හා ගුරුගේ මාලාව

36.ගුඳ ගති ගත වට්ටමට අයත් තාල රූපය

i මාත්‍රා 2+2 සුළු තනි තිතවේ ii මාත්‍රා 2+3 සුළු මැදුම් දෙතිතවේ

iii මාත්‍රා 3+4 මැදුම් මහ දෙතිතවේ iv මාත්‍රා 2+4 සුළු මහා දෙතිතවේ

37.මාත්‍රා 2+2+3 තුන් තිතේ තාල රූපයට නටනු ලබන්නේ

i අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම ii ශුද්ධතලය සින්දු වන්නම

iii නාතිලිංචි සින්දු වන්නම iv හවාදී තාල සින්දු වන්නම

38.ඉහත රූප සටහනේ දැක්වෙන බෙරය අක්ෂර A B C පෙන්නුම් කරනුයේ




i බෙරපුහුල, වෙනිවර, හැක්ම

ii වරපට, වෙනිවර කැරැල්ල,බෙර කඳ

iii හැක්ම, ගැටිවැල, සුරත්තට්ටුව

iv බෙර කඳ, බෙර ලණුව, වරපට

39.පහතරට බෙරය වාදනයේදී වම් අතේ මා පට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි 04 බෙරයේ හයිතට්ටුවට වදින සේ වාදනය කරන්නේ

i තත් යන අක්ෂරය ii දිත් යන අක්ෂරය

iii තොං යන අක්ෂරය iv නං යන අක්ෂරය

40.පහතරට දෙවොල් ඇඳුම් කට්ටලය අයත් රංග වස්ත්‍රාභරණ වනුයේ

i. හැට්ටය, රැලි සාය හා කාඟුල් කුට්ටම
ii. හැට්ටය, සේලය හා වෙස් මුහුණු
iii. සේලය, පච්චවඩම හා කෙමෙත්තම්
iv. සේලය, පච්චවඩම හා හස්තකඩය

**නර්තනය (දේශීය) II**

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්යය වේ
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

01.

i. සොකරි ගැමි නාටකයේ ඔසරිය අඳින්නේ ......................................ය.

ii. බලි ශාන්ති කර්මයේදී බලි ඇදුරාගේ වම් අතට ගන්නා වාද්‍ය භාණ්ඩය නම් ..............................

iii. උඩරට නර්තන සම්ප්‍රදායේ අස්නේ නර්තනය ගායනය ......................................
නර්තනයකි. යක් ඇනුම ගායනය .................................... නර්තනයකි.

iv. දොං ජිං ජිං තකට දොංතක මෙම බෙරපදය මාත්‍රා .............................. දෙතිතට අයත්වේ.

v. ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් 2 වනුයේ අංග රචනය සහ .......................... රචනයයි.

vi. වෙස් මුහුණු පැළඳීම ප්‍රධාන ලක්ෂණයක් වන ජන නාටකය වන්නේ ................................ ය

vii. රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට භාවිතා වූ විතතාතත අවනද්ධ භාණ්ඩය වන්නේ ......................යි.

viii. ලී දැතට රැගෙන කණුවක් වටේ රටා මවමින් නර්තනය කරන ද්‍රවිඩ නැටුම වන්නේ.......................

ix. ............................. විසින් අධ්‍යක්ෂණය කළ මුද්‍රා නාට්‍ය .......................... නම් වේ.

x. .......................... 1 වන පරාක්‍රමබාහු රජු විසින් පොළොන්නරු යුගයේදී ඉදි කළ බව චූල වංශයේ සඳහන් වේ.
(ල.12)

02.

i. සුළු මහ දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ල.04)
ii. ''අහසට පිඹිනා '' මෙම කවිය (3+3) තාලයට ප්‍රස්ථාර කරන්න. (ල.04)
iii. සැව්ලා වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ල.04) (ල.12)

03.

i. ශාන්ති කර්ම පැවැත්වීමේ හේතු 04ක් ලියන්න. (ල.04)
ii. දෙවොල් මඩු ශාන්ති කර්මයේ එන නර්තන අංග 02ක් නම් කරන්න. (ල.04)
iii. පහන් මඩු ශාන්ති කර්මය සඳහා භාවිත වන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කර එය අතීතයේ සන්නිවේදන කාර්යයන් සඳහා යොදා ගෙන ඇති ආකාරය විමසන්න. (ල.04) (ල.12)

04.

i. සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 02ක් ලියන්න. (ල.04)
ii. කෝලම් නාටක රඟ මඩල පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.04)
iii. ගැමි නාටක චරිත මගින් සාමාජය පිළිබඳ විවරණය කරයි විමසන්න. (ල.04) (ල.12)

05.

i. විදේශීය භාරතීය නර්තන ශෛලීන් 04ක් නම් කරන්න. (ල.04)
ii. ඒ ඒ සම්ප්‍රදායන් 04ට අයත් ප්‍රධාන එක් වාද්‍ය භාණ්ඩයක් බැගින් ලියන්න. (ල.04)
iii. මණිපූරි නර්තනය බිහිවීමට තුඩු දුන් සාධාකය ලියා දක්වන්න. (ල.04) (ල.12)

06.

i. රූපවාහිනී නර්තනය හේතු කොටගෙන නර්තන කලාවේ ආගමනයට ඉමහත් පිටුවහලක් සිදුවිය විමසුමට ලක් කරන්න. (ල.04)
ii. මානසික ස්වස්ථතා පවත්වාගැනීමට නර්තනය කෙතරම් ඉවහල් වන්නේදැයි විමසන්න (ල.04)
iii. සාරධර්ම රැකීම, වැඩිහිටියන්ට ගරු කිරීම, සාමූහික බව යන ගුණාංග නර්තන කලාව හැදෑරීමෙන් ප්‍රගුණ වන්නේදැයි විස්තර කරන්න (ල.04) (ල.12)

**<u>පිළිතුරු I පත්‍රය</u>**

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 16 | 2 |
| 2 | 4 | 17 | 1 |
| 3 | 3 | 18 | 2 |
| 4 | 4 | 19 | 2 |
| 5 | 3 | 20 | 3 |
| 6 | 1 | 21 | 4 |
| 7 | 4 | 22 | 3 |
| 8 | 1 | 23 | 2 |
| 9 | 3 | 24 | 3 |
| 10 | 1 | 25 | 4 |
| 11 | 3 | 26 | 1 |
| 12 | 4 | 27 | 4 |
| 13 | 3 | 28 | 3 |
| 14 | 2 | 29 | 1 |
| 15 | 3 | 30 | 3 |

## II කොටස උඩරට

| | | | |
|---|---|---|---|
| 31 | 2 | 36 | 1 |
| 32 | 2 | 37 | 2 |
| 33 | 2 | 38 | 1 |
| 34 | 2 | 39 | 2 |
| 35 | 1 | 40 | 1 |

## II කොටස පහතරට

| | | | |
|---|---|---|---|
| 31 | 4 | 36 | 1 |
| 32 | 3 | 37 | 2 |
| 33 | 2 | 38 | 4 |
| 34 | 2 | 39 | 1 |
| 35 | 1 | 40 | 1 |

# නර්තනය (දේශීය) II පිළිතුරු පත්‍රය

01.

i. සොකරිය
ii. අත්මිණිය
iii. සහිත/ රහිත
iv. 123 1234 , (3+4) , මැදුම් මහ
v. ආහාර්යයය
vi. කෝලම්
vii. දවුල
viii. ලී වල්ලිය
ix. අංජලිකා චිත්‍රසේන / කුම්භකතාව
x. සරස්වති මණ්ඩපය

02.

i. නිවැරදිව ප්‍රස්ථාර කර ඇත්නම් එකකට ලකුණු 04 බැගින් මුළු ප්‍රස්ථාරයටම ලකුණු 12ක් වේ

03.

i. අදාළ හේතු සඳහා (ල 04)
ii. නර්තන අංග 02 නම් කර ඇත්නම්
iii. දවුල නම්කර විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න

04.

i. අදාළ පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න (ල 04)
ii. කෝළම් රඟ මඩල හැඳින්වීම (ල 04)
iii. ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න

05.

i. භරත කථක් කථකලි මණිපුරි
ii. සම්ප්‍රදායට අදාළ ඕනෑම එක් අදාළ භාණ්ඩ සඳහා ලකුණු ලබා දෙන්න
iii. ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න

06.

i. නිවැරදිව විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න
ii. ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න
iii. නිවැරදිව පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න